තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

## එල්. විතානගේ එ. කෘෂිකර්ම හා ගොවි රක්ෂණ මණ්ඩලය

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය වශයෙන් විභාග කිරීම)/ 1565/2019 (2020.01.06 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම
**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී.හපුආරච්චි

**අභියාචක** - එල්. විතානගේ
නොතිසි ලත් පාර්ශවය - නම් කළ නිලධාරී කෘෂිකර්ම හා ගොවි රක්ෂණ මණ්ඩලය

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 07.02.2019 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නොමැත |
| නම් කල නිළධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 12.03.2019 |
| නම් කල නිළධාරියා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 10.04.2019 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු**:

අභියාචක විසින් 07.02.2019 දිනැති තොරතුරු ඉල්ලීම් මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

වැන්දඹු අනත්දරු හිමිකම් ඇති අයෙකුට ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාගත හැකිද යන්න දැනගැනීමට. (දැනට වැන්දඹු අනත්දරු ප්‍රතිලාභ නොලබන)

තොරතුරු නිලධාරියා පනත ප්රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 12.03.2019 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 10.04.2019 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය මේ වන තෙක් කිසිදු පිළිතුරක් අභියාචක වෙත හෝ කොමිසම වත ලබා දීමට අපොහොසත් වී ඇත. ඉල්ලා සිටින ලද තොරතුර 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව ලබා දිය හැකි තොරතුරක් බව කොමිසම තීරණය කරයි.

**නියෝගය:**

අභියාචක විසින් මෙම තොරතුරු ඉල්ලීම මගින් ඉල්ලා සිටින ලද තොරතුරු, 2016 අංක 12 දරන තොරතුරු පනත මගින් ලබා දිය නොහැකි තොරතුරක් නොවන බවට කොමිසම නිරීක්ෂණය කරයි. අදාල තොරතුරු ලබා දීමට නොහැකි වීමට හේතු පවතී නම්, ඒ කුමන හේතු මතද යන්න පනත ප්‍රකාරව පිළිතුරු ලබා දීමට පොදු අධිකාරිය මේ වනතෙක් අපොහොසත් වී ඇත.

එබැවින් තොරතුරු ඉල්ලීමට අදාළ ලේඛන අභියාචක වෙත ලබා දෙන ලෙස කොමිසම මින් නියෝග කරයි. තවද එම තොරතුරු පොදු අධිකාරිය සතුව නොමැති නම් ඒ බවද අභියාචකට සහ කොමිසම වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස කොමිසම වැඩිදුරටත් පොදු අධිකාරිට නියෝග කරයි.

මෙම අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.

*****